# 5 ඒකකය

# අපේ අතීත රජවරු

## 1 පාඩම

## පණ්ඩුකාභය රජතුමා

මෙරට රජකම් කළ පණ්ඩුකාභය රජතුමාගේ මව චිත්‍රා කුමරිය වන අතර පියා දීඝගාමිණී කුමරුය. පණ්ඩුකාභය කුමරු රජවීම වැළැක්වීමට මොහුගේ මාමාවරු උත්සාහ කළ ද මොහු බොහෝ කරදර මැද වීර්යයෙන් සියලු කරදර පරාජය කොට මෙරට රජු බවට පත් විය. තරුණ වියට පත් වූ පණ්ඩුකාභය කුමරු ස්වර්ණමාලි කුමරිය විවාහ කර ගත්තේය.

පණ්ඩුකාභය රජු තම පාලන මධ්‍යස්ථානය ලෙස එවකට "අනුරාධගම" ලෙස පැවති දියුණු නොවූ ප්‍රදේශය දියුණු කරමින් "අනුරාධපුරය" ලෙස නම් කොට එය තම වාසයට තෝරා ගත්තේය. අනුරාධපුර නගරය වටා සීමා ලකුණු කොට නගරයකට අවශ්‍ය ආරක්ෂාව සඳහා දිය අගලක්, නගරයට ඇතුළුවීමට දොරටු සතරක්, නගරයේ සිට අනෙකුත් ප්‍රදේශයන්ට පිවිසීමට ප්‍රධාන මාර්ග පද්ධතියක් සකසා සැලසුම් සහගත නගරයක් ලෙස ඉදි කරන ලදී. එහෙයින් අතීතයේ ප්‍රථම සැලසුම්ගත නගරය ලෙස "අනුරාධපුරය " සඳහන් කරයි. නගරයේ අලංකරණය වැඩි දියුණු කිරීමට කැලිකසල, වැසිකිලි කැසිකිලි පිරිසිදු කරන්නන් මෙන්ම නගරයෙන් පිටතට මළ සිරුරු ගෙන යන්නන් හා සොහොන් පිරිසිදු කරන්නන් නගරය තුළට පත් කරන ලදී. කෘෂි කර්මාන්තයේ දියුණුව සඳහා නගරයක් තුළ ප්‍රථමවරට වැවක් මෙතුමන් විසින් ඉදි කරන ලද අතර, එය " අභය වැව" ලෙස ද වර්තමානයේ දී "බසවක්කුලම වැව" ලෙස ද මෙය හඳුන්වයි. සියලු ආගමිකයන්ට තම ආගමික කටයුතු සිදු කර ගැනීමට අවස්ථාව සලසා දුන් මෙතුමා වසර 70 ක් (හැත්තෑවක්) මෙරට රජකම් කළේය.

❖ **ඡේදය කියවා පහත අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. පණ්ඩුකාභය රජුගේ මව, පියා හා බිසවගේ නම් සඳහන් කරන්න.
2. පණ්ඩුකාභය රජතුමන් තම පාලන මධ්‍යස්ථානය ලෙස තෝරා ගනු ලැබූ ප්‍රදේශ කුමක් ද?
3. රජතුමා විසින් අනුරාධපුර නගරයේ ආරක්ෂාවට යෙදූ උපක්‍රම මොනවා ද?
4. අනුරාධපුර නගරයේ අලංකරණය ඇතිකරලීම සඳහා පණ්ඩුකාභය රජ පත් කළ පුද්ගලයින් කවුරුන් ද ?
5. පණ්ඩුකාභය රජු ඉදි කරන ලද අභය වැව වර්තමානයේ හඳුන්වන නම කුමක් ද?

6. රට වැසියන් වෙනුවෙන් පණ්ඩුකාභය රජතුමා කොපමණ කලක් මෙරට සේවය කළේ ද?

7. පණ්ඩුකාභය රජතුමාගේ චරිතය තුළින් ඔබගේ ජීවිතයට ලබා ගත හැකි ආදර්ශය කුමක් ද?

## 2 පාඩම

## දේවානම්පියතිස්ස රජතුමා



(i) මිහිඳු මහරහතන් වහන්සේ මෙරටට වැඩම කරන විට ශ්‍රී ලංකාවේ පාලකයාව සිටි රජතුමා කවුරුන්ද ?

(ii) එම රජතුමාගේ මව හා පියා නම් කරන්න.

(iii) අශෝක අධිරාජ්‍යයා වෙත පිටත් කරනු ලැබූ දූත පිරිසෙහි නායකයා කවුරුන් ද ?

(iv) "දේවානම්පිය'' යන්නෙහි තේරුම සඳහන් කරන්න.

(v) මිහිඳු මහරහතන් වහන්සේ ශ්‍රී ලංකාවට බුදු දහම රැගෙන ආවේ බුදු රජාණන් වහන්සේ පිරිනිවන් පෑමෙන් අවුරුදු කීයකට පසු ද ?

(vi) පහත "A" කොටස හා "B" කොටස ගැලපෙන ලෙස යා කරන්න.

| | "A" කොටස | "B" කොටස |
|---|---|---|
| (i) | භික්ෂූන් වහන්සේලාට දානය වැළඳීමට ඉදි කළ ශාලා | ථූපාරාමය |
| (ii) | ධාන්‍යාකාර හැඩය හා දකුණු අකු ධාතුව | අට සැට ලෙන් |
| (iii) | සංඝමිත්තා තෙරණිය ශ්‍රී මහා බෝධිය වැඩම වීම. | ලහබත් ගේ |
| (iv) | මිහිඳු හිමියන් ඇතුළු පැවිදි පිරිස වාසය කිරීමට | දඹකොළ පටුන වරාය |
| (v) | අනුරාධපුරයේ නගර සීමා ලකුණු කිරීම | අනුලා දේවිය |
| (vi) | මෙරට භික්ෂු ශාසනය ඇරඹීම | මහා පදුම සහ කුංජ |
| (vii) | ශ්‍රී ලංකාවේ භික්ෂුණී සසුන ඇරඹීම | අරිට්ඨ කුමරු |

**3 පාඩම**

## දුටුගැමුණු රජතුමා

දුටුගැමුණු රජතුමා අපේ රට පාලනය කළ කාරීය ශූර, බුද්ධිමත් පාලකයෙකි. මෙතුමාගේ පියා කාවන්තිස්ස රජතුමා වන අතර මව විහාර මහා දේවියයි. ඔහුට තිස්ස නමින් සහෝදරයෙක් සිටියේය.

මෙතුමා ජීවත් වූයේ මාගම රාජධානිය වූ රුහුණු රට නමින් හැඳින් වූ ශ්‍රී ලංකාවේ ගිණිකොන දිග හා දකුණු පළාත් වලටයි.

දුටුගැමුණු රජුගේ බාල කාලයේදී අනුරාධපුරය පාලනය කළේ එළාර නම් රජුය. මොහු ධාර්මික පාලකයෙකි. මාතොට වරායේ වෙළෙඳ කටයුතු වලින් හා ගොවිතැනෙන් ලැබුණු සියලු ආදායම් ලබා ගත්තේ එළාර රජුය.

දුටුගැමුණු කුමරු කුඩා කල සිටම මෙරට විදේශ ආධිපත්‍යයන් මුදවා ගැනීමටත්, රට දියුණු කිරීමටත් අදිටන් කරගෙන සිටි අතර ඔහුගේ පියාවන කාවන්තිස්ස රජු ඒ සඳහා අවශ්‍ය වන පිරිසද සකස් කොට ආහාර සුලබ කිරීමට කටයුතු කර, දුටුගැමුණුගේ සොහොයුරා වන තිස්ස කුමරු දිගාමඩුල්ලට යැවීය. ඒ වර්තමානයේ අම්පාර නමින් හැඳින්වෙන ප්‍රදේශයයි.

විජිතපුර ප්‍රදේශයේදී දුටුගැමුණු හා එළාර අතර පැවති යුද්ධයේදී අවුරුදු හතලිස් හතරක් පමණ අනුරාධපුරයේ ගෙන ගිය එළාරගේ රාජ්‍ය පාලනය අවසන් විය. එළාර රජු පැරදවීමට දුටුගැමුණු රජුට සේනාපතිවරු දස දෙනෙක් උදව් කලෝය. ඒ නම් නන්දිමිත්‍ර, සුරනිමල, මහාසෝන, ගෝඨයිම්බර, ථේරපුත්තාභය, බරණ, වෙළුසුමන, ලභියවසභ, ඛංජදේව, ඵුස්සදේව (දස මහා යෝධයෝ). කණ්ඩුල නම් ඇතෙක්ද ඔහුට උදව් කළේය.

දුටුගැමුණු රජතුමා අනුරාධපුරයේ රජ වීමෙන් පසු එතුමා විසින් ඉදිකළවෙහෙර විහාර නම්,

රුවන්වැලිසෑය
මිරිසවැටිය — වෙහෙර

ලෝවාමහාපාය - විහාර

රුවන්වැලිසෑය ඉදිකර අවසන් වන්නට පෙර එතුමා මිය ගිය අතර ඉන් පසු රුවන්වැලි සෑයේ වැඩ නිම කළේ ඔහුගේ සොහොයුරු සද්ධාතිස්ස කුමරුය. දුටුගැමුණු රජතුමා වෙහෙර විහාර අනූනවයක් කළ බව සඳහන් වේ.



- දුටුගැමුණු රජුගේ මුල් නම ගාමිණී අභය යන්නයි. රජ වීමෙන් පසු දුටුගැමුණු යන නම භාවිතා කළේය.
- දුටු - යනු දෘෂ්ඨ යන්නයි ( සංස්කෘත භාෂාවේ එහි තේරුම බුද්ධිමත් යන්නයි.)

  බුද්ධිමත් (දෘෂ්ඨ) ගාමිණී දුටුගැමුණු විය.

  <u>දුටුගැමුණු රජුගේ ගුණාංග -</u>

  - බුද්ධිමත්ව හා ධෛර්යවන්තව කටයුතු කර සිත දිනා ගැනීම.
  - රටට ආගමට හිතවත් වීම
  - ගරු කළ යුත්තන්ට ගරු කිරීම
  - රටවැසියන්ට ආදරය කිරීම

## <u>රුවන්වැලි මහා සෑය</u>

- ඓතිහාසික මූලාශ්‍රවල මහා සෑය නමින් හැඳින්වේ.
- පාලි භාෂා පොත් වල රත්නමාලි සෑය නමින් හඳුන්වා ඇත.
- ඉන්දියාවේ රාමගම දාගැබේ තැන්පත් කොට තිබුණු බුදුරජාණන් වහන්සේගේ ශාරීරික ධාතු රුවන්වැලි සෑයේ නිධන් කොට ඇති බව කියවේ.
- මෙම ස්ථූපයේ උස අඩි 298 කි.
- මෙහි ඉදිකිරීම් කටයුතු අවසන් කළේ සද්ධාතිස්ස රජුය.



- සද්ධාතිස්ස රජුගේ පුත් ලජ්ජිතිස්ස රජු විසින් රුවන්වැලි සෑය ප්‍රතිසංස්කරණය කර ඇත.

**ඉහත සඳහන් තොරතුරු හොඳින් කියවා, පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

1. දුටුගැමුණු රජුගේ මවගේ හා පියාගේ නම් කුමක්දැයි ලියන්න.
2. දුටුගැමුණු රජු සමග අනුරාධපුර රාජ්‍යත්වය ලබා ගැනීම සඳහා සටන් වැදුනු රජතුමා කවුද?
3. දුටුගැමුණු රජුගේ සොහොයුරාගේ නම කුමක්ද? ඔහු ජීවත් වූ ප්‍රදේශය අතීතයේදී හා වතමානයෙදී හැඳින්වූ නම් වෙන වෙනම ලියන්න.
4. දුටුගැමුණු රජුගේ සෙන්පතියන් ලෙස කටයුතු කළ දස මහා යෝධයන් නම් කරන්න.
5. දුටුගැමුණු රජුගේ මුල් නම කුමක්ද? එහි අර්ථය ලියන්න.
6. දුටුගැමුණු රජුගෙන් ඉටුවූ සේවාවන් තුනක් සඳහන් කරන්න.
7. රුවන්වැලි මහා සෑය නමින් බිත්ති පුවත්පතකට ලිපියක් සකස් කරන්න.
8. ශ්‍රී ලංකාවේ ආකෘති සිතියමකපහත සඳහන් ස්ථාන ලකුණුකර නම් කරන්න.
    - අනුරාධපුරය
    - වෙල්ලස්ස ( අම්පාර )
    - මල්වතු ඔය
    - විජිතපුරය
9. දුටුගැමුණු රජතුමා විසින් කරවන ලද පහත සඳහන් ස්ථාන වල පින්තූර සොයා තොරතුරු ඇතුලත් පොතක් සාදන්න.
    - රුවන්වැලි සෑය
    - මිරිසවැටිය
    - ලෝවාමහාපාය

## <u>4 පාඩම</u>

## <u>වළගම්බා රජතුමා</u>

එදා ඉරිදා දිනයක් විය. අනුහස් තම අධ්‍යාපන කටයුතු නිමවා මිදුල පුරා එහේ මෙහේ ඇවිදිමින් සිටියේය. ඔහු නොවිසිලිමත්ව මිදුල පුරා යමින් සිටියේ දිය නෑමට ගිය අත්තම්මා නැවත ගෙදර පැමිණෙන තෙක්ය. සෑම ඉරිදා දිනයක සවස තම අත්තම්මා කියා දෙනු ලබන රජ කතා අනුහස් ඉතාමත් ආශාවෙන් රසවිඳින්නට පුරුදු වී සිටියේය. අත්තම්මා දිය නාගෙන පැමිණෙනු දුටු අනුහස්

අනුහස් :- අත්තම්මේ, අත්තම්මා අද මට රජ කතාවක් කියලා දෙන්නේ නැද්ද?

අත්තම්මා :- ඇයි නැත්තේ පුතේ චුට්ටක් ඉන්නකෝ අද මම පුතාට බුදු දහම රැකගන්න වගේම දකුණු ඉන්දියාවේ සොලීන්ගෙන් රට බේරාගත් වීර වළගම්බා රජ්ජුරුවන්ගේ කතාව කියලා දෙන්නම්කෝ.

(අත්තම්මා රෙදි ටික වැලට දමා හරිබරි ගැසී ගෙපිල උඩ ඉඳගත්තාය. අනුහස් අත්තම්මාගේ ඔඩොක්කුවට පැන ඉතා උනන්දුවෙන් අත්තම්මාගේ මුහුණ දෙස බලා සිටින්නට විය.)

අත්තම්මා :- ඕන්න පුතේ අපේ රටේ රජකරපු සද්ධාතිස්ස කියන රජතුමාගේ පුතා තමයි වළගම්බා රජතුමා කියන්නේ. අනේ මන්ද වළගම්බා කුමාරයාගේ අම්මා ගැන නම් දැන ගන්න සඳහන් තොරතුරක් මම දන්නේ නෑ.

අනුහස් :- ඇයි අම්මා නැද්ද? සහෝදරයෝත් නැද්ද? අත්තම්මේ ඒ රජ්ජුරුවන්ට ???

අත්තම්මා :- අම්මා ගැන දැනගන්ට නෑ සහෝදරයෝ නම් තුන්දෙනෙක් ඉන්නවා . ථූලත්ථන, ලජ්ජතිස්ස සහ නාග කියලා . නාග කියන සහෝදරයාට "ඛල්ලාට නාග" කියලත් පස්සේ කාලේ මිනිස්සු කීවලු.

අත්තම්මා :- වළගම්බා රජතුමා රජවෙන කාලේ එතුමාට ගොඩක් කරදර වලට මුහුණ දෙන්ට උනා පුතේ, දකුණු ඉන්දියාවේ සොලීන් අපේ රට ආක්‍රමණවලටත් මුහුණ දෙන්ට උනාලු. ඒ අතර තිස්ස කියලා බ්‍රාහ්මණයෙකුගේ කැරැල්ලකටත් මුහුණ දෙන්න වෙලා තියෙනවා.

අනුහස් :- ඉතිං අත්තම්මේ වලගම්බා රජතුමා ඒ යුද්ධ වලින් දිනුවාද ?

අත්තම්මා :- අපෝ ඇයි නැත්තේ මුලදී ආක්‍රමණයන්ට මුහුණ දෙන්න බැරිව උන්නාන්සේ පලා ගියා. ඒ යනකොට ගිරි කියලා නිගන්ඨයෙක් උන්නාන්සේට මහා කළු සිංහලයා පලා යනවෝ කියලා අපහාස කලාලු. ඊට පස්සේ උන්නාන්සේ ධෛර්යය ඇරගෙන ආයෙත් යුද්ධ කරලා අපේ රට සොලීන්ගෙන් නිදහස් කරගෙන ඒ ගිරි කියන නිගන්ඨයා හිටිය තැන තමයි අද "අභය ගිරි " චෛත්‍යය හදලා තියෙන්නේ පුතේ. අනේ සාදු, සාදු

අනුහස් :- ආ ..... මම තාත්තාත් එක්ක අභයගිරි විහාරයට ගිහින් තියෙනවා. ඒ චෛත්‍යය අඩි 245 ක් උසයි. කියලා කිව්වා. හැබැයි ඒත් තැන්පත් කරලා තියෙන්නේ මොනවාද කියලා දන්නේ නැතිලු.

අත්තම්මා :- ඔව් පුතේ අභයගිරිය හදලා තියෙන්නේ වළගම්බා රජ්ජුරුවෝ තමයි. එය පූජා කරලා තියෙන්නේ කුපික්කලතිස්ස භික්ෂූන් වහන්සේට.

අනුහස් :- එතකොට අත්තම්මේ අර බුදු දහම රකින්න ධර්මය ග්‍රන්ථාරූඪ කලා කීවේ ඒ මොකක්ද?

අත්තම්මා :- ආ , ඔව් පුතේ.... ඉස්සර කාලේ බුදු හාමුදුරුවෝ කීව බණ හාමුදුරුවරු අහගෙන ඉදලා කටපාඩම් කරලා තමයි ආයෙත් බණ කියලා තියෙන්නේ. ඒක නිසා මාතලේ අළු විහාරයේ දී වළගම්බා රජතුමාගේ මුල් වීමෙන් ත්‍රිපිටකය පොත්වල ලියලා ආරක්ෂා කරගෙන තියෙන්නේ. ඒ වගේම මෙතුමාගේ තියෙන උතුම් ගතිගුණ නිසා ඒ කියන්නේ එයාගේ සහෝදරයාගේ (බල්ලාටනාග) පුතා තාත්තාගේ මරණයෙන් පසු බලා ගත්ත හින්දා "පිතරජ "කියලත් හඳුන්වනවා.

අනුහස් :- අත්තම්මේ .... ඇත්තටම මේ රජතුමා ඉතා හොඳ කෙනෙක් නේද ?

අත්තම්මා :- ඔව් පුතේ ඒකට එක හේතුවක් තමයි එයාට උදාර ගතිගුණ තියෙන, නිර්භීත සෝමා දේවිය කියලා බිරිඳක් ඉදලා තියෙනවා. අද නිරතුරුව රජතුමාගේ ආරක්ෂාව ගැන බලලා තියෙනවා. ඉතිං පුතේ වෙහෙර විහාර හදලා, බුදු දහම ග්‍රන්ථාරූඪ කරලා හාමුදුරුවන්ට ඉගෙන ගන්න පිරිවෙන් හදපු වළගම්බා රජතුමා රටට ගොඩාක් වටින කියන පුද්ගලයෙක් පුතේ.

අනුහස් :- ඇත්තටම අත්තම්මේ මටත් හිතෙනවා ඒ රජ්ජුරුවෝ වගේ මම ඉපදුණ රටට ලොකු උනාම හොඳ සේවයක් කරන්න ඕනේ කියලා.

අත්තම්මා :- ඒක හරි පුතේ ... අපි ඉපදුණ රට තියෙන්නේ අතීතයේ වීර රජවරු හින්දා. ඉතිං මගේ පුතාටත් පුළුවන් එහෙම කෙනෙක් වෙන්න.

❖ **ඉතින් කතාන්දරය ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01). වළගම්බා රජුගේ පියාගේ නම කුමක් ද?

02). වළගම්බා රජුගේ සොහොයුරන් කී දෙනෙක් සිටියේ ද? ඔවුන්ගේ නම් සඳහන් කරන්න.

03). වළගම්බා රජු රාජ්‍ය පාලනය කරන කාලයේදී මුහුණ දීමට සිදු වූ ආක්‍රමණ මොනවාද?

04). මෙම රජතුමන් විසින් ඉදිකරන ලද ප්‍රධාන විහාරය කුමක්ද ? එහි උස කොපමණද ?

05). "පිතරජ " වශයෙන් වළගම්බා රජු හැඳින්වීමට හේතුව කුමක්ද?

06). වළගම්බා රජු මෙරට පාලනය කිරීමේදී රටට කළ වෙනත් සේවාවන් කරුණු වශයෙන් ලියා දක්වන්න.

07). බුද්ධ ධර්මට ග්‍රන්ථාරූඪ කරණු ලැබූයේ කොහේද ?

08). වළගම්බා රජුගේ සහායට සිටි බිරිඳගේ නම කුමක්ද ?

09). " අභයගිරි " චෛත්‍ය පිළිබඳව ඔබ දන්නා කරුණු 05 ක් ලියන්න.

10). වළගම්බා රජුගේ චරිතය තුළින් ඔබට ගත හැකි ආදර්ශය ලියා දක්වන්න.

**5 පාඩම**

## වසභ රජතුමා

වසභ රජතුමා ලම්භකර්ණ රජ පෙළපතේ ආරම්භකයා වේ. දෙමාපියන් පිළිබඳව සඳහනක් දැනගත නොහැකි මෙතුමා කුඩා කළ තම මාමාවරුන් යටතේ හැදී වැඩී ඇත. බුදු දහමේ සුභසිද්ධිය වෙනුවෙන් මෙතුමන් ථූපාරාමය දාගැබ වටා වටදාගෙයක් තැනවීම, ඉසුරුමුණි විහාරයේ පොහොය ගෙයක් ඉදිකිරීම, තිස්සමහාරාමයේ සිතුල්පව්ව විහාරයේ දාගැබක් ඉදි කිරීම වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය යන ශාසනික සේවාවන් ඉටු කළේය.

එපමණක් නොව මෙරට වැව් සංස්කෘතිය ඉතාමත් දියුණු වූයේ වසභ රාජ්‍යය සමයේදීය. පළමු වරට විශාල වැව් එකොළහක් ද, කුඹුරුවලට වැව්වල සිට ජලය ගෙන යාමට ඇළ මාර්ග දොළහක් ද සකස් කළේය. සැතපුම් 30 ක් දිග ඇළහැර ඇළ වසභ රජුගේ නිර්මාණයකි. "මයෙන්ති" හෙවත් මහවිලච්චිය වැව, මානාකැටි හෙවත් වර්තමානයේ මානන්කට්ටිය වැව, වාතමංගණ වැව හෙවත් වර්තමානයේ නොච්චිපොතාන වැව වසභ රජුගේ ඉදිකිරීම් ලෙස සඳහන් වේ. උමං ජල මාතිකා ක්‍රමය වසභ රජුගේ ඉංජිනේරුවන් විසින් මෙරටට හඳුන්වා දුන්නකි.

රට පාලනයේ පහසුවට ශ්‍රී ලංකාව බෙදා පාලනය කළේය. යාපනයේ පාලනයට "ඉසිගිරිය" නම් ඇමතියෙක් පත් කළ බවට වල්ලිපුරම් ප්‍රදේශයෙන් හමු වූ "වල්ලි පුරම් රන්පත් " ඉරුවේ සඳහන් වේ. අනුරාධපුර නගරය වටා ප්‍රාකාරයක් ඉදිකරමින් අවුරුදු 40 ක් මෙරට ජනයාගේ ජීවන පහසුව සඳහා බදු අය කිරීමේ ක්‍රමයක් ද හඳුන්වා දෙමින් දැහැමින් වසභ රජු රට පාලනය කළේය.

**ඡේදය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

1. වසභ රජුගේ රජ පෙළපතේ නම කුමක් ?
2. බුදු දහමේ දියුණුවට මෙතුමන් විසින් ඉටු කළ සේවාවන් මොනවාද
3. වසභ රජතුමා මෙරට කෘෂි කර්මාන්තයේ දියුණුවට ඉටු කළ වාරි සංස්කෘතිකමය යුතුකම් මොනවාද?
4. වසභ රජතුමන් නිර්මාණය කරනු ලැබූ ප්‍රධාන ඇළ මාර්ගය හා එහි දිග සඳහන් කරන්න.
5. ගැලපෙන ලෙස යා කරන්න.

| | අතීතයේ දී | වර්තමානයේදී |
|---|---|---|
| (i) | මයෙන්ති වැව | නොච්චිපොතාන වැව |
| (ii) | මානාකැටි වැව | මහවිලච්චිය වැව |
| (iii) | වාතමංගණ වැව | මානන්කට්ටිය වැව |

6. වසභ රජුගේ ඉංජිනේරුවරු විසින් මෙරට වැව් සංස්කෘතිය තුළ හඳුන්වා දුන් නිර්මාණ කුමක්ද ?
7. ලංකාව බෙදා පාලනය කිරීමේදී යාපනයේ පාලනයට රජු විසින් පත් කරන ලද පාලකයා කවුරුන් ද?
8. "වල්ලිපුරම් රන්පත් ඉරුව" යනු කුමක් ද ? එහි සඳහන් වන්නේ කුමක් පිළිබඳව ද ?
9. අනුරාධපුර නගරයේ ආරක්ෂාවට වසභ රජු ඉදිකරනු ලැබුයේ කුමක් ද?
10. රටවැසියන්ගේ ජීවන යහපත වෙනුවෙන් රජු හඳුන්වා දුන්නේ කුමන ක්‍රමයක් ද?
11. වසභ රජු කොපමණ කලක් මෙරට රජකම් කළේ ද ?
12. වසභ රජතුමාගේ ජීවන චරිතයෙන් ඔබට ලබා ගත හැකි ආදර්ශය කුමක් ද?

## <u>6 පාඩම</u>

## <u>මහසෙන් රජතුමා</u>

මම වෙනදාටත් වඩා උනන්දුවෙන් පාසල් යාමට සැරසුනෙමි. එයට හේතුව වූයේ අද සිකුරාදා බැවින් අපගේ පාසලේ සති අන්ත සමිති වාරය අද දිනට යෙදී ඇති බැවින් අද මට ද මෙම සමිතියේ කථාවක් කිරීමට අවස්ථාව උදා වී තිබූ බැවිනි. එහෙයින් මා විසින් සාරාංශයන් වශයෙන් ලියාගෙන තිබූ තොරතුරු කොළය ගෙන නැවත බැලුවෙමි.

"අද මාගේ කථාව වන්නේ මින්නේරි දෙවියන් පිළිබඳවයි". මින්නේරි දෙවියන් ලෙස හඳුන්වන්නේ අපගේ මහසෙන් රජතුමායි. මෙතුමා මේ නමින් හඳුන්වා ඇත්තේ ඉතා විශාල එනම් දිග සැතපුම් එකයි කාලක් වන වැව් බැම්මක් සහ විශාලත්වයෙන් අක්කර 4670 ක් වන එදා මිණිහිර වැව ලෙස හැඳින් වූ මින්නේරිය වැව ඉදි කිරීම නිසා වෙනි. මෙතුමාගේ පියා " ගෝඨාභය" රජතුමා වන අතර සොහොයුරු "ජෙට්ඨතිස්ස" නම් වේ.

මෙම රජු විසින් වල්ලුරවාපි නම් එනම් හුරුළු වැවත් ඛානු වැව එනම් කනදරා වැවත් ඉදි කර තිබේ. බුදු සසුනේ උන්නතිය වෙනුවෙන් මින්නේරි විහාරය, ගෝකණ්ණ විහාරය, ඒකාපිල්ල විහාරය, දාසෙන්ගල විහාරය යනාදී වෙහෙර විහාර ඉදි කර ඇති අතර "ජේතවනය" ඉන් ප්‍රධානය. අඩි 400 කින් උසින් යුත් පාදම විශ්කම්භය අඩි 370 ක් වන ජේතවනය ලොව විශාලතම ගඩොලින් ඉදිකළ ස්ථූපයයි. මෙහි බුදුන්ගේ පටී ධාතුව නිධන් කර ඇති බව මූලාශ්‍රවල කියවේ. තම රට වැසියා වෙනුවෙන් සේවය කොට රටවැසියාගෙන් දෙවියෙකු ලෙස පිදුම් ලබන මහසෙන් රජු අපේ රටට මහත් සේවාවක් කළ රජ කෙනෙකි. කියවා අවසන් වූ මම වේලාව බැලුවෙමි. එයට හේතුව වූයේ පාසල් වෑන් රථයේ නලා ශබ්දයයි.

❖ **ඉහත ලිපිය කියවා පහතින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. මහසෙන් රජතුමා හඳුන්වනු ලබන තවත් නමක් ලියන්න.

2. මින්නේරි වැවෙහි වැව් බැම්මේ දිග හා එහි විශාලත්වය අක්කර කොපමණ ද?

3. පහත  වගුව පුරවන්න.

| මහසෙන් රජුගේ පියා සහ සොහොයුරුගේ නම් | ඉදි කරන ලද වැව් | | ඉදි කරන ලද වෙහෙර විහාර |
|---|---|---|---|
| 1.<br>2.<br>3.<br>4.<br>5. | අතීතයේ හැඳින්වූ නම | වර්තමාන නාමය | |
| | | | |

4. ජේතවන චෛත්‍යය පිළිබඳව සඳහන් වන විශේෂ කරුණු එකිනෙක ලියා දක්වන්න.

5. මහසෙන් රජතුමාගෙන් ලබා ගත හැකි ආදර්ශ පිළිබඳව වාක්‍ය  05 ක් සඳහන් කරන්න.

## 8 පාඩම

## ධාතුසේන රජතුමා

ධාතුසේන රජුගේ පියා දාඨානාම සහ සලතිස්බෝ නම් බාල සහෝදරයෙකි. රජු බලයට පැමිණෙන විට දකුණු ඉන්දීය ආක්‍රමණිකයන් පණ්ඩු පාරින්ද, බුද්ධ පාරින්ද යන ආක්‍රමණිකයන් අනුරාධපුර පාලනය කරන ලදී. බුද්ධ පාරින්ද හා පණ්ඩු පාරින්ද බෞද්ධ ආගමට සේවය කළ අය වූහ. ධාතුසේන රජු මෞර්ය වංශයට අයත් වේ.

බුදු දහමේ දියුණුවට වෙහෙර විහාර ඉදි කිරීම, ප්‍රතිසංස්කරණය, භික්ෂූන් වහන්සේලාට ඇප උපස්ථාන කිරීම, අනුරාධපුරයේ මහාපාලී දාන ශාලාව ප්‍රතිසංස්කරණය රජතුමන් සිදු කළ ආගමික සේවාවන් වේ.

ධාතුසේන රජතුමන් කෘෂි කර්මාන්තය වෙනුවෙන් මහ වැව් දහ අටක් සහ කුඩා වැව් දහ අටක් ද ප්‍රධාන වශයෙන් කලා වැව ඉදි කරන ලදී. එමෙන්ම කලා වැවේ සිට අනුරාධපුරයේ තිසා වැව දක්වා යෝධ ඇළද නිර්මාණය කරන ලදී. මෙම යෝධ ඇළ සැතපුම් 54 කි. එය ජය ගඟ නමින් ද හඳුන්වයි. මෙලෙසින් රටේ කෘෂි කර්මාන්තයට මෙන්ම බුදු සසුනේ දියුණුවට උදාර ලෙස වසර දහ අටක් සේවය කරමින් කාශ්‍යප හා මුගලන් යන පුතුන් දෙදෙනාව මෙරටට දායාද කළේය.

❖ **ඉහත ඡේදය කියවා පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සයපන්න.**

1. (i) ධාතුසේන රජුගේ පියාගේ නම කුමක් ද?

   (ii) ඔහුට සහෝදරයින් කී දෙනෙක් වේද? ඔවුන්ගේ නම් සඳහන් කරන්න.

   (iii) රජු බලයට පැමිණෙන විට අනුරාධපුරය පාලනය කළේ කවුරුන් ද?

   (iv) ධාතුසේන රජු කුමන වංශයට අයත් අයෙක් ද?

2. (i) බුදු දහමේ දියුණුව වෙනුවෙන් රජතුමන් විසින් සිදු කළ සේවාවන් 03 ක් ලියන්න.

   1.

   2.

   3.

3. ධාතුදේන රජු ඉදි කළ මහ වැව් හා කුඩා වැව් ප්‍රමාණය කොපමණ ද?

4. "ජය ගඟ" නමින් හැඳින්වූයේ කුමක් ද?

5. ධාතුසේන රජුගේ ප්‍රධාන ඉදිකිරීම් කුමක් ද?

6. ධාතුසේන රජුගේ පුතුන් දෙදෙනාගේ නම් ලියා දක්වන්න.

7. ධාතුසේන රජුගෙන් ඔබගේ ජීවිතයට ලබා ගත හැකි ආදර්ශ තුනක් ක් ලියන්න.